# ඇන්තූරියම් වගාව බේරා ගනිමු



කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශණයකි



ලෝකයේම ඇන්තූරියම් වගාවන්ට ප්‍රබල තර්ජනයක් වූ ඇන්තූරියම් බැක්ටීරියා අංගමාරය දැනට වර්ෂ දෙක තුනක කාලයක සිට ලංකාවේද තැනින් තැන දක්නට ඇති අතර, ඇතැම් ඇන්තූරියම් වගාවන් සහමුලින්ම විනාශ කර ඇත.

ඇන්තූරියම් ගසට මෙම රෝගය ඇති කරනුයේ, සැන්තොමොනාස් කැම්පෙස්ට්‍රිස්, ඩිපෙන්බාකියේ *(Xanthomonas campestris*, pv. *dieffenbachiae)* බැක්ටීරියාව විසිනි.

*Xanthomonas* රෝග කාරකයා ඇන්තූරියම් ශාකයේ තුවාල ඔස්සේ හා ළපටි පත්‍ර ඔස්සේ ශාකයට ඇතුල් වුවද, මුලින්ම රෝග ලක්ෂණ පෙන්නුම් කරනුයේ මේරූ පත්‍ර වලය.

තවද මෙම බැක්ටීරියාව රෝග ලක්ෂණ නොපෙන්වා ඉතා දිගු කලක් ශාකය තුල රැඳී පවතී.

## රෝග ලක්ෂණ

(1) මුලින්ම පත්‍ර අග්‍රස්ථයේ හෝ දාරයේ සිට ඇතුල් පැත්තට විහිදෙන සේ පත්‍ර තලය කහ පැහැ වීම හා දෙවනුව වියළී යෑම සහ ඉන්පසු හිරුඑළියට පිළිස්සුනාක් මෙන් පත්‍රයේ තැන තැන වියළී යෑම.



(2) මුළු පත්‍රයම කහ පැහැති වීම.



(3) ශාකයේ රෝගය වැඩි වූ අවස්ථාවේ මල් කොළපුවද අග්‍රස්ථයේ සිට වියළී යෑම.

(4) මෙලෙස ආසාධිත පත්‍ර පහසුවෙන් කදෙන් ගැලවී යෑම හා ඒ නිසා මුළු ශාකයම විනාශ වීම.

## බැක්ටීරියා අංගමාරය බව තහවුරු කර ගැනීමට සුළු පර්යේෂණයක්

රෝග ලක්ෂණ පෙන්වන පත්‍රයක් ශාකයෙන් වෙන් කරගෙන එහි නටුව පිරිසිදු ජලය සහිත වීදුරු භාජනයක ගිල්වා තබන්න. (නටුවේ කැපුම් තලය භාජනය පතුලේ නොගෑවෙන ලෙස)



බැක්ටීරියා අංගමාරය නම් නටුවේ කැපුම් තලයේ පෙනෙන නොපෙනෙන උකු තරලයක් ලෙස බැක්ටීරියා ජලයට ගමන් කරයි.

## රෝගය පැතිරීම

1. රෝපණ ද්‍රව්‍ය මගින්
   i. ආසාදිත ශාකයේ කඳ කොටස් හා පැල
   ii. ආසාදිත ශාක වල බීජ
2. ජලය මගින්
3. අත් හා භාවිතා කරන උපකරණ මගින්
4. රෝපණ මාධ්‍යය මගින්



ආසාදිත බීජ පැල

## අංගමාරයෙන් බේරී සිටීමට ...

විශ්වාසදායක ස්ථානයකින් නිරෝගී රෝපණ ද්‍රව්‍ය මිලදී ගන්න. ඔබ අළුතින් ගෙන එනු ලබන පැල වෙනම ස්ථානයක මාස 2 - 3 ක් පමණ කල් තබා, රෝග ලක්ෂණ ඇති නොවේනම් පමණක් ඔබගේ නිරෝගී පැළ ආසන්නයේ තබන්න.

ශාකවලට හොඳින් පොහොර හා ජලය ලබා දෙන්න. ජලය යෙදීමේදී ශාකයෙ මුල් ප්‍රදේශයට පමණක් ජලය යොදන්න. නිතරම පරීක්ෂාකාරීව සිටින්න, රෝග ලක්ෂණ සහිත පැළෑටි දුටු වහාම ගලවා විනාශ කරන්න.

## රෝග පාලනය

1. බැක්ටීරියා රෝග මර්ධනයට ප්‍රතිජීවක භාවිතා කලද ඉතා ඉක්මණින් ප්‍රතිරෝධී ප්‍රභේද ඇතිවන බැවින් ක්ෂේත්‍රයේදී ශාක රෝග මර්ධනය සඳහා ප්‍රතිජීවක ඖෂධ නිර්දේශ කරනු නොලැබේ.

2. සනීපාරක්ෂණය, රෝග සහිත පැළ උදුරා පුළුස්සා දැමීමට හා එම ස්ථානයේ පස ජීවාණුහරණය කිරීම රෝගය පැතිරීම පාලනයට උදවු වෙයි.

3. ප්‍රතිජීවක නොවූ බැක්ටීරියා නාශනයට හැකියාව ඇති ඇතැම් විෂබීජ නාශක දියර භාවිතය මගින්ද රෝගය බෝවීම අඩු කර ගත හැක.
   උදා:- පයිසාන් 20 (වෙළඳ නාමය)
   ඇලිඑට් 80 (ජ. ද්‍රා. කු)

4. ශාකය මතුපිටට ජලය යෙදීම අවම කිරීම, බිංදු ජල සම්පාදනය හා සෙවන අඩි 10-12 දක්වා එසවීම යන ක්‍රම මගින් ක්ෂේත්‍රයේ ජල වාෂ්ප ආර්ද්‍රතාවය අඩු කර ගත හැකි අතර, එමගින් රෝගය පැතිරීම අඩු කරයි.

***ඇන්තූරියම් වගාවේ බැක්ටීරියා අංගමාරය වලක්වා ගන්න !***

***උසස් තත්වයේ ඇන්තූරියම් නිෂ්පාදනයට අපෙන් උපදෙස් !***

